(හයවැනි පාර්ලිමේන්තුව — තෙවැනි සභාවාරය)

අංක. 51]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2008 නොවැම්බර් මස 27 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0040/'08

1.

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, අතිගරු ජනාධිපතිතුමාගේ උපදේශකවරුන් හා අමාත්‍යවරුන් විසින් 2006 ජනවාරි 01 වැනි දින සිට 2007 ජුනි මස 30 වැනි දින දක්වා කාලය තුළ භාවිතා කරන ලද හෙලිකොප්ටර් සඳහා රජය විසින් වැය කරන ලද මුළු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද; සහ

(ii) අතිගරු ජනාධිපතිතුමාගේ උපදේශකවරුන් සහ අමාත්‍යවරුන් ඉහත සඳහන් කරුණ වෙනුවෙන් වැය කරන ලද මුදල සවිස්තරාත්මකව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජයට කිසිදු වියදමක් දැරීමට නොමැතිව ගුවන් හමුදා හෙලිකොප්ටර් භාවිතා කර තිබේද;

(ii) අතිගරු ජනාධිපතිතුමා හා ගරු අග්‍රාමාත්‍යතුමා හැර හෙලිකොප්ටර් භාවිතා කළ අනෙක් පුද්ගලයන්ගේ නම් හා භාවිතා කරන ලද වාර ගණන කොපමණද;

(iii) ඉහත සඳහන් පුද්ගලයින් සඳහා පෞද්ගලික සමාගම්වලට අයත් හෙලිකොප්ටර් භාවිතා කර තිබේද; සහ

(iv) එසේ නම්, පුද්ගලයාගේ නම හා වියදම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0089/'08

2.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) රජයෙන් නිසි උපදෙස් නොලැබීම නිසා, මුදල් බවට පත්කර ගැනීමට නොහැකිව රාජ්‍ය ආයතන සතුව තිබෙන විදේශ මුදල් ප්‍රමාණය කොපමණදැයි එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව, මහජන බැංකුව සහ ලංකා බැංකුව සම්බන්ධයෙන් ඉහත සඳහන් තොරතුරු ඇතුළත් අංග සම්පූර්ණ ලැයිස්තුවක් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම වරද නිවැරදි කිරීමෙහි ලා ගනු ලබන පියවර කවරේද;

(ii) ජාතික ගිණුම් සැකසීමේදී මෙම අවිනිශ්චිත වගකීම සලකා නොබැලීමට හේතුව කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0090/'08

3\.

ගරු රවි කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) නිදහස ලබා ගැනීමෙන් පසුව ශ්‍රී ලංකා රජය පළමුවැනි වරට විදේශීය ආයතනවලින් සහ රටවලින් ණය ලබාගත් දිනය කවරේද;

(ii) එවකට බලයේ සිටි ජනාධිපතිවරයාගේ හා අග්‍රාමාත්‍යවරයාගේ නම් සහ අදාළ වර්ෂය කවරේද;

(iii) පළමුවැනි එක්සත් ජනපද ඩොලර් භාණ්ඩාගාර බැඳුම්කරය නිකුත් කළ දිනය කවරේද;

(iv) එවකට සිටි ජනාධිපතිවරයාගේ, අග්‍රාමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ නම් කවරේද;

(v) රජයක් විසින් පළමුවැනි වතාවට එක්සත් ජනපද ඩොලර් වාණිජ ණයක් ලබා ගැනීමට කටයුතු කළ දිනය කවරේද;

(vi) එවකට සිටි ජනාධිපතිවරයාගේ, අග්‍රාමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අද වන විට පවතින මුලු ණය ප්‍රමාණය සහ දේශීය හා විදේශීය ණය ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අද වන විට පවතින ඒක පුද්ගල ණය ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0164/'08

4\.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ පාරිභෝගික නිලධාරි තනතුර සඳහා 2007.01.11 වැනි දින දෙවැනි සම්මුඛ පරීක්ෂණය පැවැත් වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) සම්මුඛ පරීක්ෂණයට කැඳවූ සංඛ්‍යාව හා 2007.01.11 වැනි දිනට පැවති තනතුරු සංඛ්‍යාව කොපමණද;

(ii) තනතුරු සංඛ්‍යාව වැඩිකිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමතිය ඉල්ලා සිටියේ නම් අදාළ සංඛ්‍යාව හා දිනය කවරේද;

(iii) 2007.01.11 වැනි දින සම්මුඛ පරීක්ෂණයට සහභාගි වූ අයගේ නම, ලිපිනය, ලබාගත් ලකුණු වෙන් වෙන්ව කවරේද;

(iv) දෙවැනි සම්මුඛ පරීක්ෂණයේ දී කුසලතා පදනමින් තෝරාගත් අයට පත්වීම් ලබානොදීමට හේතුව කවරේද;

(v) මැයි මස 07 වැනි දින තවත් දෙවැනි සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමට හේතුව කවරේද;

(vi) මේ සඳහා 2007.01.11 වැනි දින නොකැඳවූ අය කැඳවා තිබේනම් ඊට හේතුව කවරේද;

(vii) ඔවුන්ගේ නම, ලිපිනය සහ ලබාගත් ලකුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2007.01.11 වැනි දින පැවති සම්මුඛ පරීක්ෂණයේ දී 5 වැනි ස්ථානයට පසුපසින් සිටි සංචාරක මණ්ඩලයේ ජාතික සේවක සංගමයේ හිටපු සභාපතිවරයාගේ දියණිය වන එම්. එන්. ද අල්විස් යන අය 2007.05.07 වැනි දින පැවති සම්මුඛ පරීක්ෂණයෙන් ඉදිරියට ගෙන පත්වීම් ලබාදී ඇති බවත්;

(ii) මෙහිදී ජයප්‍රියා ආදිහෙට්ටි යන අය ඉවත්කිරීම මගින් සුදුසුකම් ලැබූ අයට අසාධාරණයක් වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) මෙම තත්වය නිවැරදි කිරීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0243/'08

5.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— ජාතිය ගොඩනැගීමේ සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතිය ගොඩනැගීමේ (කැබිනට් නොවන) එක් එක් අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න එක් එක් නිල නිවස සඳහා වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම එක් එක් නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0265/'08

6.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— වෙළෙඳ, අලෙවි සංවර්ධන, සමූපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාරිභෝගික කටයුතු (කැබිනට් නොවන) අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0266/'08

7.

ගරු ආර්. පී. ඒ. රණවීර පතිරණ මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වාරිමාර්ග (කැබිනට් නොවන) අමාත්‍යතුමා සඳහා නිල නිවාසයක් ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය රජය සතු දේපලක්ද;

(iii) රජය සතු නොවේ නම් කවර පදනමක් යටතේ එය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිල නිවසක් ලබා දී තිබේ නම්, එය 2005, 2006 සහ 2007 වර්ෂ තුළ අලුත්වැඩියා කර හෝ වැඩිදියුණු කර තිබේද;

(ii) අලුත්වැඩියා කළේ නම් ඉහත එක් එක් වර්ෂවල වැයකළ මුදල කොපමණද;

(iii) ඉහත නිවාසයේ ප්‍රයෝජනය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂ තුළ රජයේ වියදමින් ගෘහභාණ්ඩ හෝ වෙනත් උපකරණ මිලදී ගෙන තිබේද;

(iv) එසේ නම්, ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) මෙම නිල නිවාසය සඳහා 2005, 2006 සහ 2007 වර්ෂවල එක් එක් මාසය තුළ භාවිතා කර ඇති විදුලිය හා ජල ඒකක ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ සඳහා අදාළ අමාත්‍යාංශය මගින් ඉහත එක් එක් වර්ෂයේ සහ එක් එක් මාසය තුළ වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0304/'08

8.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,—කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වික්ටෝරියා කලාපයට අයත් අඹකොටේවත්තෙන් විකල්ප පදනම යටතේ ඉඩම් ලබා ඇති පදිංචිකරුවන් වාර්ෂික බදු මුදල් ගෙවිය යුතු බවට නියෝගයක් පනවා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 1983 දක්වා අඹකොටේවත්තේ වතු කම්කරුවන් ලෙස සේවය කළ මොවුන්ට, වික්ටෝරියා ජලාශයට යටවූ ඉඩම්වල සිටි පදිංචිකරුවන් ලෙස අදාළ වතුයායේ ඉඩම් ලබාදීම හේතුකොට ගෙන රැකියාව අහිමිවූ බවත්;

(ii) ඔවුන්ගේ ගව පට්ටි හා කුකුල් පාලනය වැනි අතුරු ආදායම් මාර්ගද ඇනහිටි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) මොවුන්ට ලබා දී ඇති මහවැලි ඉඩම් වලින් බදු මුදල් අයකර ගැනීම නවතා සහනයක් සලසාදීමට එතුමා පියවර ගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0409/'08

9.

ගරු අචල ජාගොඩගේ මහතා,— තරුණ කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) 2007 වර්ෂය තුළ එතුමියගේ අමාත්‍යාංශයට හෝ අමාත්‍යාංශය සතු දෙපාර්තමේන්තු හා සංස්ථා හෝ වෙනත් ආයතන සඳහා අලුතින් පිරිසක් රැකියා සඳහා බඳවාගෙන තිබේද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම එක් එක් ආයතනය සඳහා බඳවාගෙන ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඒ ඒ තනතුර සඳහා බඳවාගෙන ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ අතුරින් සේවයේ ස්ථිර කර ඇති සංඛ්‍යාව සහ උපාධිධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0473/'08

10.

ගරු විජිත රණවීර මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2007.12.31 වැනි දිනට හම්බන්තොට දිස්ත්‍රික්කයේ කටුවන ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශය තුළ තිබෙන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතුරින් මහ වාරි, සුළු වාරි සහ වර්ෂා පෝෂිත වශයෙන් ගැනෙන බිම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2007.12.31 වැනි දිනට අදාළ බල ප්‍රදේශය තුළ සිටින කුඹුරු ගොවිතැන් කරන අඳ ගොවි සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ඉඩම් හිමි ගොවි සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(iii) ඒ හැර වෙනත් ගොවීන් සිටීනම් එම ගොවීන් සංඛ්‍යාව හා වගා කරන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) 2000 වර්ෂයේ ගොවිජන සංවර්ධන පනත ක්‍රියාත්මක වීමෙන් පසු 2007.12.31 දක්වා කාලය තුළ අඳ ගොවියා මියයාම හේතුවෙන් ඉඩම් හිමියා සහ අනුප්‍රාප්තිකයා අතර පැන නැඟී ඇති ගැටළු සංඛ්‍යාව කොපමණද;

(ii) ගොවිජන සේවා සහකාර කොමසාරිස් වෙත අදාළ බල ප්‍රදේශය තුළින් වාර්තා වී ඇති අඳ ගොවි ගැටළු සංඛ්‍යාව කොපමණද;

(iii) අඳ ගොවි අයිතිවාසිකම් ලැබූ අනුප්‍රාප්තිකයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0512/'08

11.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පරිසර හිතකාමී, බැටරි බලයෙන් ක්‍රියාත්මක වන මෝටර් රථ ලංකාවට ආනයනය කරන බව එතුමා දන්නෙහිද?

(ආ) එම වාහන ලංකාවට ආනයනය කරන රටවල් සහ දේශීය නියෝජිතයින් කවුරුන්ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ලංකාවේ වාහන වලින් සිදුවන පරිසර විනාශය වැළැක්වීම සඳහා බැටරි බලයෙන් ක්‍රියා කරන මෙම මෝටර් රථ ඉතා යෝග්‍ය බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) (i) පරිසර හිතකාමී වන මෙම මෝටර් රථ ගෙන්වීමේදී ආනයනික බදු සහන ලබා දීමට ක්‍රියා කරන්නේද;

(ii) මෙම වාහන එකලස් කිරීමේ කර්මාන්ත ශාලා ලංකාවේ ආරම්භ කිරීමට අවස්ථාව ලබා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0638/'08

12.

ගරු තිලකරත්න විතානාච්චි මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රජයට අයත්ව තිබූ හෝමදොල වතුයායේ ඉහළ හෝමදොල කොටස නො.2 සහ අක්කර 80 ඉඩම්, වටවල වැවිලි සමාගමට බදු පදනම මත ලබාදෙන විට තිබූ අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) වටවල වැවිලි සමාගමට බදු දීමෙන් අනතුරුව 2007 දෙසැම්බර් වන විට ගම් පුළුල් කිරීම හෝ අනවසර නියමානුකූල කිරීම යටතේ ලබාදී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එසේ රජයට ලබාදීමෙන් පසු ඉතිරි ඉඩම්වල මායිම් නිරවුල් ව පවත්වාගෙන තිබේද;

(iv) මායිම් නිරවුල්ව පවත්වා නොගැනීම නිසා ඇති වන අනවසර අත්පත්කර ගැනීම් වැළැක්වීමට ගනුලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ආ) (i) හෝමදොල වතුයායට මායිම්ව ඉහත ප්‍රදේශවල පෞද්ගලික වතු තිබේ නම් ඒ කවරේද;

(ii) එම පෞද්ගලික ඉඩම් හිමියන් ඉහත වතුයායේ ඉඩම් අත්පත් කරගෙන තිබේද;

(iii) එසේ නම් එම ඉඩම් නැවත වතු සමාගමට පවරා ගැනීම කොපමණ කාලසීමාවක් තුළ සිදුකරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0714/08

13\. ගරු ජේමසිරි මානගේ මහතා,— ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ධීවරයින් තම වෘත්තියේ නිරතවීම සම්බන්ධයෙන් රජය විසින් ක්‍රියාත්මක කරන නීතිරීති කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම නීතිරීති හේතුවෙන් ධීවරයින් විශාල අසීරුතාවයකට පත්ව සිටින බවත්;

(ii) ධීවර වෘත්තිය නිසියාකාරයෙන් කරගෙන යාමට නොහැකි නිසා ධීවර ජනතාවට රජය මගින් සහනයක් ලබා දිය යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, අදාළ සහනය ලබාදීමට පියවර ගන්නේ කවර කාල පරාසයක් තුළද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0715/08

14\. ගරු ජේමසිරි මානගේ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2008.07.09 වැනි දින ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය සහ දුම්රිය දෙපාර්තමේන්තුව මගී ප්‍රවාහනයෙන් උපයන ලද ආදායම කොපමණද;

(ii) එදින මගී ප්‍රවාහනය සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සහ දුම්රිය දෙපාර්තමේන්තුව වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2008.07.10 වැනි දින ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය සහ දුම්රිය දෙපාර්තමේන්තුව මගී ප්‍රවාහනයෙන් උපයන ලද ආදායම කොපමණද;

(ii) එදින මගී ප්‍රවාහනය සඳහා ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය සහ දුම්රිය දෙපාර්තමේන්තුව වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0736/08

15.
ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කුසලතා පදනම මත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 2(II) පන්තියට ඇතුළත්වීම සඳහා 2006 වර්ෂයේ විභාගයක් පැවැත්වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ සඳහා දැනට කොපමණ සංඛ්‍යාවක් තෝරාගෙන තිබේද;

(ii) අදාළ අවම ලකුණු මට්ටම කවරේද;

(iii) මෙම පත්වීම් ලබා දී ඇති කුසලතා ස්ථානය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මොණරාගල, හුලංදාව, පිළිසරණ මාවතේ, අංක 17 හි පදිංචි ඩී. එම්. ජේමාවති මහත්මිය (විභාග අංක 0019305) මේ සඳහා වූ අවම ලකුණු මට්ටමට වඩා ලකුණු ලබාගෙන ඇති බවත්;

(ii) එහෙත් ඇයට අදාළ තනතුරු සඳහා කැඳවීමක් ලැබී නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඈ) එසේ නම්, මෙම අය අදාළ සේවයට බඳවාගැනීමට අවශ්‍ය පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) බඳවාගෙන ඇති අයගේ ලකුණු ප්‍රමාණය හා නාමලේඛනය එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේදී

## යෝජනා පිළිබඳ දැනුම් දීම

1.
පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— 2008 දෙසැම්බර් මස 01 වැනි සඳුදා, 02 වැනි අඟහරුවාදා, 03 වැනි බදාදා, 04 වැනි බ්‍රහස්පතින්දා, 05 වැනි සිකුරාදා සහ 08 වැනි සඳුදා යන දිනයන් " විසර්ජන පනත් කෙටුම්පත (2009)" සලකා බැලීම සඳහා වෙන් කළ දිනයන් විය යුතුය.

2.
පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— ස්ථාවර නියෝග 70(2) හි කුමක් සඳහන්ව තිබුණද, " විසර්ජන පනත් කෙටුම්පත (2009)" සලකා බැලීම සඳහා 2008 දෙසැම්බර් මස 01 වැනි දින සිට 05 වැනි දින දක්වා ඇති වෙන් කළ දිනයන්හි රැස්වීම් පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ.භා. 5.30 දක්වා විය යුතුය. අ.භා. 5.00 ට ස්ථාවර නියෝග අංක 7හි (5) සහ (6) ඡේදයන් ක්‍රියාත්මක විය යුතුය.

3.
පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— ස්ථාවර නියෝග 70(2) හි කුමක් සඳහන්ව තිබුණද, " විසර්ජන පනත් කෙටුම්පත (2009)" සලකා බැලීම සඳහා 2008 දෙසැම්බර් මස 08 වැනි සඳුදා රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.30 සිට අ.භා. 3.00 දක්වා විය යුතුය. අ. භා. 3.00 ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතුය.

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*අ1.

විසර්ජන පනත් කෙටුම්පත (2009) - (දහසයවැනි වෙන්කළ දිනය) — කාරක සභාව (ප්‍රගතිය නොවැම්බර් 26)

*2.

ප්‍රවාහන අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 306— වැඩසටහන 2,—† 2008 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2008 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් මිලියන එක්දහස් පණහකට (රු. 1,050,000,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතුය.

උපලේඛනය

| | | | |
|---|---|---|---|
| ශීර්ෂය | 306 | — | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව |
| වැඩ සටහන | 2 | — | සංවර්ධන කටයුතු |

| | |
|---|---|
| පුනරාවර්තන වියදම් | රු. 186,000,000 |
| ප්‍රාග්ධන වියදම් | රු. 864,000,000 |
| එකතුව | රු. 1,050,000,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2008 නොවැම්බර් මස 08 වැනි දින ඉදිරිපත් කරන ලද 2008 අංක 9 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 8 දක්වා එකතුව රුපියල් 27,039,980,332.

*3.

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත යටතේ නියමය— 1984 අංක 6 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනතේ 48 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 ජූනි මස 06 දිනැති අංක 1552/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.11.04 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතුය.

*4.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— 2002.01.28 වැනි දින රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගනු ලැබූ මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක මහතා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දාහත්වැනි සංශෝධනයේ 27(2) වගන්තිය යටතේ 2002.01.29 වැනි දින සිට නැවත එම ධුරයට පත් කරන ලදුව, ඉන් අනතුරුව රාජ්‍ය සේවයේ කරන ලද වැටුප් සංශෝධනවලට අනුව මැතිවරණ කොමසාරිස්වරයාගේ වැටුප් 2006.11.23 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරන ලද නමුත් ලේකම්වරුන්ගේ ව්‍යවස්ථාව යටතේ මෙම ධූරයට හිමි වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම සම්බන්ධයෙන් එම අවස්ථාවේ නිශ්චය නොකරන ලද හෙයින් මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක මහතා නැවත එම ධූරයට පත් කළ 2002.01.29 වැනි දින සිට ධූරය දරන තාක් කාලයට හිමි වැටුප් වර්ධක අගයන් ද වැටුපට එකතු කොට වැටුප් ගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*5.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153(1) ව්‍යවස්ථාව අනුව එස්. ස්වර්ණජෝති මහතා 2008.01.04 වැනි දින සිට විගණකාධිපති ධුරයට පත් කරන ලදුව, අනතුරුව විගණකාධිපති තනතුරට හිමි එස්එල්-4 රු. 47,515-12x1,425-64,615 වැටුප් ක්‍රමයේ රු.58,915 වැටුප් පියවරේ පිහිටුවීමට තීරණය කරන ලදී. ස්වර්ණජෝති මහතා ධුරය දරන තාක් කල් වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම අමාත්‍ය මණ්ඩලය විසින් 2008.08.06 වැනි දින තීරණය කරන ලද හෙයින් විගණකාධිපති එස්. ස්වර්ණජෝති මහතාට 2008.01.04 වැනි දින සිට රු. 58,915ක මාසික වැටුපක් ගෙවීමට හා ධුරය දරන තාක් තනතුරට හිමි වාර්ෂික වැටුප් වර්ධක ගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*6.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 3),— අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවනු ලබන මාසික දීමනාව සිය නිත්‍ය තනතුරේ මාසික වැටුපෙන් 1/3 කට සමාන මාසික දීමනාවක් විය යුතු යැයි ද, එය 2007 ජනවාරි මස 01 වැනි දින සිට ගෙවිය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ දීමනා සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට, මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනාව ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*7.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ පාරිශ්‍රමික හා දීමනා, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14.400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද පාරිශ්‍රමිකයෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ පාරිශ්‍රමිකය 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද පාරිශ්‍රමික හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*8.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 අ(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද ජාතික පොලිස්

කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ දීමනා, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| දීමනාව | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14.400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| දීමනාව | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද දීමනාවෙන් (ඉන්ධන දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ දීමනාව 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*9.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ තීරණය,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 2(7) ඡේදය අනුව එම කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 66,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14.400.00 | මාසික |
| | එකතුව | රු. | 80,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනා | - | රු. | 12,000.00 | මාසික |
| | එකතුව | රු. | 77,000.00 | |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*10.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ යෝජනාව,— 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව පිහිටුවන ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයන්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| වැටුප | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14,400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

සාමාජිකයින්

| | | | |
|---|---|---|---|
| වැටුප | - | රු. 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගේ නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*11.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත යටතේ යෝජනාව,— 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ 4(8) වගන්තිය අනුව පිහිටුවන ලද ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිගේ හා උප සභාපතිගේ වැටුප් 2006.01.01 වැනි දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | |
|---|---|---|---|
| වැටුප | - | රු. 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. 14.400.00 | මාසික |
| | එකතුව | රු. 79,400.00 | |

උප සභාපති

| | | | |
|---|---|---|---|
| වැටුප | - | රු. 50,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. 12.000.00 | මාසික |
| | එකතුව | රු. 62,000.00 | |

තවද, වැඩි කරන ලද වැටුප් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ පාරිශ්‍රමිකය 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, 2006 වර්ෂයේ සිට මේ දක්වා කොමිෂන් සභාවේ උපසභාපති තනතුරේ සේවය කර ඇති මහාචාර්ය ලාල් පෙරේරා මහතාට සහ දැනට එම තනතුර දරන ආචාර්ය ජී.ඩී. ගුණවර්ධන මහතාට ද මෙම වැටුප් වැඩිවීම අදාළ විය යුතු යැයිද, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිට හා උප සභාපතිට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*12.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව,— 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 37 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 37 දරන නියමය

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, 2006 අංක 47 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ දෙවැනි උපලේඛනයේ විෂය අංක 30602 "ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව ගබඩා අත්තිකාරම් ගිණුම" දුම්රිය දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |

| | | | |
|---|---|---|---|
| (ii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 1,000,000,000 සිට<br>රු. 680,000,000 දක්වා | |
| (iii) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 3,800,000,000 සිට<br>රු. 3,900,000,000 දක්වා | |
| (iv) | එකී පනතේ දෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 400,000,000 සිට<br>රු. 550,000,000 දක්වා | |

(මෙම නියමය වලංගු වන්නේ 2007.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/මහින්ද රාජපක්ෂ
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය,

2008.08.28 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*13.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 25 වැනි වගන්තියේ (උ) ඡේදය යටතේ, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලදුව වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා විසින් අනුමත කරන ලද, 2008 ජනවාරි මස 10 දිනැති අංක 1531/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.04.09 වැනි දින ඉදිරිපත් කරන ලද "2008 අංක 1 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ (තේ කර්මාන්ත ශාලා ඉදි කිරීම සහ ක්‍රියාත්මක කිරීම) අවම ප්‍රමිති නියෝග" අනුමත කළ යුතුය.

*14.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥා පනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥා පනතේ 32 වැනි වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතුය.

*15.

වෛද්‍ය ආඥා පනත යටතේ නියෝග,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ඔක්තෝබර් 03),— "(105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥා පනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2006 අගෝස්තු මස 17 දිනැති අංක 1458/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2006.09.05 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*16.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥා පනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥා පනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතුය.

*17.

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*18.

ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*19.

ජාතික ජේෂකර්ම හා ඇඟලුම් ආයතනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*20.

සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*21.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජූනි 17) [1]

*22.

ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*23.

ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*24.

ඉන්දීය සම්භවයක් සහිත තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*25.

අදේශිකයන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*26.

ඉඩම් සංවර්ධන ආඥාපනත (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම.

*27.

ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04). [1]

*28.

බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18). [1]

*29.

අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*30.

සූදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*31.

ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04.) [1]

32.
දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

33.
උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

34.
ශ්‍රී පාද කල්පවෘක්ෂ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

35.
තාලියවක ශ්‍රී ආනන්ද බෝධි සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

36.
එක්සත් ජනඉසුරු පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

37.
පූජ්‍ය මූණමලේ ධම්මරතන ගුණානුස්මරණ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

38.
ලෝක බෞද්ධ මහා සම්මේලනයේ ශ්‍රී ලංකා ප්‍රාදේශීය මධ්‍යස්ථානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

## දිනට නියමිත කටයුතුවලට අදාළ සංශෝධන පිළිබඳ දැනුම්දීම

අ1.
"විසර්ජන පනත් කෙටුම්පත (2009)" නමැති පනත් කෙටුම්පතට කාරක සභාවේදී ඉදිරිපත් කරන සංශෝධන සඳහා වෙනම නිකුත් කළ "දිනට නියමිත කටයුතුවලට අදාළ අතිරේකය" නමැති පත්‍රිකාව බලන්න.

[1]
" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---